22

# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක: 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல: 1200/6, ராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
No: 1200/6, Rajamalwatta Road, Battaramulla

දුරකථන / தொலைபேசி / Fax } 011-2864051
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail } info@landcommdept.gov.lk

(1)

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / MY NO } 5/2/6/ චක්‍රලේඛ | ඔබේ අංකය / உமது இல / YOUR NO | දිනය / திகதி / DATE } 2015.12.30 |

චක්‍රලේඛ අංක - 2015/08

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්

නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්)

**ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කර ඇති ප්‍රදානපත්‍රවල පසු කටයුතු**

උක්ත කරුණට අදාළව නිකුත් කර ඇති මාගේ 2007.09.19 දිනැති අංක 2007/03 දරණ චක්‍රලේඛය හා එහි සංශෝධිත චක්‍රලේඛ කෙරෙහි කාරුණික අවධානය යොමු කරවමි.

ඉහත චක්‍රලේඛ අනුව ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරන ලද දීමනාපත්‍රයක අයිතිකරු මියගිය අවස්ථාවක කලත්‍රයාට හිමිවන ජීවිත භුක්ති හිමිකම සහතික කර ලියාපදිංචි කිරීමටත් එමෙන්ම, පසු උරුමය නම් කර නොමැති අවස්ථාවකදී අයිතිකරු සහ කලත්‍රයාගේ ඇවෑමෙන් දීමනාපත්‍රයේ අයිතිය පනතේ III වැනි උපලේඛනය අනුව සුදුසුකම් ලබන තැනැත්තාට හිමි වූ විටකදී එම හිමිකම සහතික කර ලියාපදිංචි කිරීමටත් පරිපාලනමය විධිවිධාන සලස්වා ඇත. එසේ ලියාපදිංචි කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යැවිය යුතු ලේඛණ සඳහා ආකෘතිපත්‍ර ද හඳුන්වා දී ඇත. මෙම විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් පනතේ විධිවිධාන අනුව සුදුසුකම් ලබන පුද්ගලයින් වෙත අදාළ හිමිකම් සහතික කිරීම වෙනුවට වැරදි ආකාරයට වෙනත් පුද්ගලයින් වෙත හිමිකම් සහතික කර ලියාපදිංචි කරවූ අවස්ථාවන් සමහරක් මේ වන විට වාර්තා වී ඇත. එවැනි වැරදි ලියාපදිංචි කිරීම නිවැරදි කළ යුතු ආකාරය පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරුන් හා පළාත් ඉඩම් කොමසාරිස්වරුන් විසින් මාගෙන් උපදෙස් ඉල්ලා ඇත. ඒ අනුව මෙවැනි අවස්ථාවලදී පහත සඳහන් ක්‍රියාමාර්ගය අනුගමනය කරන මෙන් කාරුණිකව දන්වමි.

වැරදි නිවැරදි කිරීම සඳහා අනුමැතිය ලබාගැනීම -:

පහත සඳහන් ආකාරයේ හිමිකම් සහතික කිරීම දෝෂ සහගත ලෙස නියමිත සුදුසුකම් නොලැබූ පුද්ගලයින් වෙත ලියාපදිංචි කර ඇති බව අනාවරණය වූ අවස්ථාවලදී ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර පළාත් ඉඩම් කොමසාරිස් /නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) වෙත පිටපතක් සහිතව මා වෙත එවා නිවැරදි කිරීම සඳහා අනුමැතිය ලබාගත යුතුයි.

I. ජීවිත භුක්තිය සහතික කිරීම

II. III වැනි උපලේඛනගත උරුමකරු වෙත ලැබුනා අයිතිය සහතික කිරීම

(2)

උරුමකරුවන්ගේ අනුමැතිය ලබාගත් පසු මෙහි ඇමුණුම 'අ' ආකෘතිය අනුව කලින් සිදු කරන ලද ජීවිත භුක්ති අයිතිය වැරදි ලියාපදිංචි කිරීම නිවැරදි කිරීම සඳහා ලේඛණයකින් අදාල ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යැවිය යුතුයි. ඒ අනුව ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් එම වරද නිවැරදි කර අදාළ පත් ඉරුවෙහි නිවැරදි පුද්ගලයාගේ ජීවිත භුක්ති අයිතිය ලියාපදිංචි කරනු ඇත.

III වැනි උපලේඛනගත උරුමකරු වෙත දෝෂ සහගත ලෙස අයිතිය සුගතික කර ලියාපදිංචි කිරීම නිවැරදි කිරීම සඳහා ඇමුණුම 'ආ' ආකෘතිය යොදා ගෙන ඉහත පරිදිම ක්‍රියා කළ යුතුයි.

මෙවැනි දෝෂ සහගත ජීවිත භුක්තිය හෝ උරුමය ලියාපදිංචි කිරීමෙන් අනතුරුව තව දුරටත් පසු උරුමය නම් කිරීම, අයිතිය පැවරීම ආදී පසු ගනුදෙනු සිදු වීමෙන් අනතුරුව එවැනි වැරදි අනාවරණය වූ අවස්ථාවකදී එවා නිවැරදි කිරීම තුලින් යම් යම් පාර්ශ්වයන් ඉමහත් පීඩාවට පත්විය හැකි අවස්ථා ද ඇත. එම නිසා එවැනි අවස්ථාවලදී අදාළ පාර්ශවයන් අතර සම්ථයකට පත් කිරීම තුලින් සියළු පාර්ශවයන් තෘප්තිමත් වන විසඳුමක් ඇති කිරීමට හැකිතරම් උත්සහා කළ යුතුයි. එම නිසා වැරදි නිවැරදි කිරීමට අනුමැතියට ඉදිරිපත් කිරීමේදී එවැනි සියළු විස්තර ඉදිරිපත් කිරීමටද ප්‍රාදේශිය ලේකම්වරුන් වගබලාගත යුතුයි.

ආර්.පී.ආර්. රාජපක්ෂ

ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත්-:

1. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය - කා.දැ.පි.
2. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - කා.දැ.පි.
3. රෙජිස්ට්‍රාර් ජනරාල් - සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත උපදෙස් නිකුත් කිරීමට
4. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන් - අ.කා.ස.

(3)

මගේ අංකය: ..............................

ඇමුණුම් අ

..................... දින ..................... කාර්යාලයේදී,

ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්

..............................

**1969 අංක 16 දරණ පනතින් හා 1981 අංක 27 දරණ ඉඩම් සංවර්ධන (සංශෝධිත) පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදානපත්‍රයෙහි දෝෂ සහගත ලෙස ලියාපදිංචි කර ඇති ජීවිතභුක්තිය සහතික කිරීම නිවැරදි කිරීම**

.............................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ .............................. පළාත් සභාවේ .............................. ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) .............................. වන මම 1969 අංක 16 දරණ පනතින් සහ 1981 අංක 27 දරණ ඉඩම් සංවර්ධන (සංශෝධිත) පනතින් සංශෝධිත (464 වන අධිකාරිය වූ) ඉඩම් සංවර්ධන ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව .............................. නමින් නිකුත් කරන ලද පහත උපලේඛනයේ විස්තර කෙරෙන අංක .............................. දරණ ප්‍රදානපත්‍රයෙහි ප්‍රදානලාභියා වූ ඉහත නම සඳහන් තැනැත්තාගේ ඇවෑමෙන් එකී ප්‍රදානපත්‍රකරුගේ නීත්‍යානුකූල කලත්‍රයා ලෙස සලකා .............................. නමින් එකී ප්‍රදානපත්‍රයෙහි ජීවිතභුක්තිය ඉඩම් සංවර්ධන ආඥා පනතේ 48 හා 48 (අ) වගන්ති යටතේ සහතික කර ලියාපදිංචි කිරීම පිණිස දන්වනු ලැබ ඇති බවත් එම ප්‍රදානපත්‍රය ලියාපදිංචි කළ පත් ඉරුවේ එම ජීවිත භුක්තිය සහතික කිරීම ලියාපදිංචි කර ඇති බවත් එහෙත් එම ජීවිත භුක්තිය සහතික කිරීම සඳහා ඉදිරිපත්ව තිබූ තොරතුරු නිවැරදි නොවන බව පෙළිදරව් වී ඇති හෙයින් එම ජීවිත භුක්තිය සහතික කිරීම දෝෂ සහගත බවත්, ඒ අනුව එම වරද නිවැරදි කරන ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් ඔහුගේ අංක .............................. දරණ .............................. දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇති හෙයින් එකී ජීවිත භුක්තිය සහතික කිරීම ලියාපදිංචි කිරීම අවලංගු කර පහත සඳහන් තැනැත්තා එකී ප්‍රදානපත්‍රයේ ජීවිත භුක්තිය හිමි තැනැත්තා ලෙස සහතික කරන හෙයින් එම තැනැත්තා ජීවිතභුක්තිකරු ලෙස ලියාපදිංචි කරන මෙන් ද කාරුණිකව දන්වා සිටිමි.

එකී උපලේඛනය :

උතුරට : ..............................

නැගෙනහිරට : ..............................

දකුණට : ..............................

බස්නාහිරට : ..............................

මෙම ප්‍රදානපත්‍රයෙහි ලියාපදිංචිය පිළිබඳ විස්තර:-

| ප්‍රදානපත්‍ර අංකය | ලියාපදිංචි අංකය | ලියාපදිංචි කළ දිනය |
|---|---|---|
| .............................. | .............................. | .............................. |

නිවැරදි ජීවිතභුක්තිකරු (ප්‍රදානපත්‍රකරුගේ කලත්‍රයා) පිළිබඳ විස්තර :-

I. නිවැරදි කලත්‍රයාගේ නාම : ..............................

II. ලිපිනය : ..............................

මෙම ලිපියේ පිටපත් 3 ක් මේ සමඟ එවමි.

ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්

(අන්තර් පළාත්)

..............................

ඇමුණුම් ආ

මගේ අංකය : ........................

........ දින ........................ කාර්යාලයේදී,

ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්

........................................

**<u>1969 අංක 16 දරණ පනතින් හා 1981 අංක 27 දරණ ඉඩම් සංවර්ධන (සංශෝධිත) පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදානපත්‍රයෙහි දෝෂ සහගතව ලියාපදිංචි කර ඇති මුල් අයිතිය සහතික කිරීම නිවැරදි කිරීම</u>**

........................ පළාත් සභාවේ ........................ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ........................ ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ........................ වන මම 1969 අංක 16 දරණ පනතින් සහ 1981 අංක 27 දරණ ඉඩම් සංවර්ධන (සංශෝධිත) පනතින් සංශෝධිත (464 වන අධිකාරිය වූ) ඉඩම් සංවර්ධන ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව ........................ නමින් නිකුත් කරන ලද පහත සඳහන් උපලේඛනයට අදාළ අංක ........................ දරණ ප්‍රදානපත්‍රයෙහි ප්‍රදානපත්‍රලාභියගේ ඇවෑමෙන් එම ප්‍රදානපත්‍රයේ උරුමය හිමි වූ සේ සලකා ........................ ට එම ප්‍රදානපත්‍රයේ මුල් අයිතිය සහතික කර එම ප්‍රදානපත්‍රය ලියාපදිංචි කළ පත් ඉරුවේ ලියාපදිංචි කරන ලෙස දන්වා ඇති බවද ඒ අනුව අදාළ පත් ඉරුවේ එය ලියාපදිංචි කර ඇති බවද එහෙත් ඉහත මුල් අයිතිය සහතික කිරීම සඳහා ඉදිරිපත්ව තිබූ තොරතුරු නිවැරදි නොවන බව හෙළිදරව් වී ඇති බැවින් එම මුල් අයිතිය සහතික කිරීම දෝෂ සහගත බවද, ඒ අනුව එම වරද නිවැරදි කරන ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් ඔහුගේ අංක ........................ දරණ ........................ දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇති බැවින් එකී මුල් උරුමය සහතික කිරීම ලියාපදිංචි කිරීම අවලංගු කරමින් පහත සඳහන් තැනැත්තා මෙම ප්‍රදානපත්‍රයේ නිවැරදි උරුමකරු වනබව සහතික කරන හෙයින් එම තැනැත්තා නමින් මුල් උරුමය සහතික කර ලියාපදිංචි කරන මෙන් ද කාරුණිකව දන්වා සිටිමි.

එකී උපලේඛනය -:

උතුරට : ........................................
නැගෙනහිරට : ........................................
දකුණට : ........................................
බස්නාහිරට : ........................................

නිවැරදි උරුමය සහතික කරනු ලැබීමට හිමිකම් ලබන තැනැත්තා පිළිබඳ විස්තර :-

I. උරුමකරුගේ නම: ........................................
II. ලිපිනය: ........................................
III. උරුමකරුගේ ඥාතිත්වය: ........................................

මෙම ප්‍රදානපත්‍රයෙහි ලියාපදිංචිය පිළිබඳ විස්තර:-

| ප්‍රදානපත්‍ර අංකය | ලියාපදිංචි අංකය | ලියාපදිංචි කළ දිනය |
|---|---|---|
| ........................ | ........................ | ........................ |

මෙම ලිපියේ පිටපත් 3 ක් මේ සමග එවමි.

ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්
(අන්තර් පළාත්)

........................................